**සවියෙන් පෙරට අපි එකට**

**e- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| ඉතිහාසය | 7 | 3 | 05. යුරෝපයේ පැරණි ශිෂ්ටාචාර<br>ග්‍රීක ශිෂ්ටාචාරය |





*සැකසුම:රුවනි නිරාෂා පතිරගේ*

*බප/හො/දොන් පේද්‍රික් මහා විද්‍යාලය*

# ග්‍රීසියේ පිහිටීම


Albania
Greece
Istanbul
Turkey
Kalambaka
Aegean Sea
Delphi
Athens
Izmir
Ephesus
Pamukkale
Olympia
Nauplion
Kusadasi
Mykonos
Patmos
Mediterranean Sea
Rhodes
Heraklion


Atlantic Ocean
Greece
Pacific Ocean
Indian Ocean
Pacific Ocean
Atlantic Ocean
Southern Ocean
Copyright © Ontheworldmap.com

# ග්‍රීසියේ පිහිටීම විමසා බලමු

* බටහිරින් අයෝනියානු මුහුදටත් නැගෙනහිරින් ඊජියන් මුහුදටත් මැදිව මධ්‍යධරණී මුහුදට නෙරා පිහිටි අර්ධද්වීපය සහ ඊට දකුණින් ඇති ක්‍රීට දූපත ඇතුළු දූපත් සමූහය මුල් කරගෙන ග්‍රීක ශිෂ්ටාචාරය බිහිවිය

- ග්‍රීසිය කඳු වලින් පිරුණු රටකි
- ඔලිම්පස් කන්ද වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත
- කඳු අතරින් ගලාබස්නා ජල මාර්ග නිසා කෘෂි කර්මාන්තයට යෝග්‍ය පරිසරයක් පැවතිණි.



# ග්‍රීක ශිෂ්ටාචාරයෙහි ආරම්භය

- ග්‍රීක ශිෂ්ටාචාරය ආරම්භ වීමට පෙර එම ප්‍රදේශ ආශ්‍රිතව මිනෝවන් ශිෂ්ටාචාරය පැවතිණි
- අවට ප්‍රදේශ වලින් පැමිණි විවිධ ගෝත්‍ර හා ජනවර්ග හේතුවෙන් මිනෝවන් ශිෂ්ටාචාරය පරිහානියට පත්විය
- එම ගෝත්‍ර හා ජන කොටස් කුඩා ගම්මාන පිහිටුවා ගැනීමෙන් ක්‍රි.පූ 2000 පමණ වන විට ග්‍රීක ශිෂ්ටාචාරය බිහිවිය.

# ග්‍රීක ශිෂ්ටාචාරයෙහි පාලනය

* ක්‍රි. පූ 700 වන විට ග්‍රීසියේ නගර රාජ්‍ය රැසක් බිහිවිය
* නගර රාජ්‍ය පෞර රාජ්‍ය ලෙසද හැඳින්වේ
* ඇතන්ස් හා ස්පාටා ප්‍රධාන නගර රාජ්‍ය දෙක විය

# පෞර රාජ්‍යයක දැකිය හැකි ලක්ෂණ

* භූමි ප්‍රදේශය කුඩා වීම
* ජනගහනය සීමිත වීම
* පුරවැසියන්ට පමණක් දේශපාලන අයිතිවාසිකම් ලැබීම

පෙරික්ලීස් නම් පාලකයාගේ කාලය ඇතන්ස් හි ස්වර්ණමය යුගය ලෙස සැලකේ. පෙරික්ලීස් ඇතන්ස් නගර මැද ඇති කුඩා කඳු ගැටයක ඇක්‍රොපොලිස් හෙවත් අගනගරය ඉදි කළේය

# ග්‍රීක පාලකයෝ

- ග්‍රීක පෞර රාජ්‍ය පසු කළෙක එකිනෙකා අභිභවා නැගී සිටියේය
- මෙම අසමගියෙන් ප්‍රයෝජන ගත් මැසිඩෝනියාවේ පිලිප් රජු ග්‍රීසිය ආක්‍රමණය කළේය
- පිලිප් රජුගේ මරණින් පසු ඔහුගේ පුත් මහා ඇලෙක්සැන්ඩර් ග්‍රීසිය අල්ලාගෙන එහි රජවිය

# ග්‍රීක ආර්ථිකය

* ගොවිතැන
* සත්ත්ව පාලනය
* වෙළඳාම

යන අංග තුනෙන් සමන්විත විය

# ග්‍රීක මැටි බඳුන්

## ග්‍රීකයෝ අලංකාර මැටි බඳුන් තැනීමට සමත් වූහ







# ගොවිතැන

* ප්‍රධාන වගාවන්- තිරිඟු, බාර්ලි, ධාන්‍ය, මිදි,










# සත්ත්ව පාලනය

* ඇතිකරන ලද සතුන්- ගවයන්, එළුවන් , බැටළුවන්







# වෙළෙඳාම

* වෙළෙඳ සම්බන්ධතා පැවැත්වූ රටවල්

  ඉන්දියාව, චීනය, ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටවල්

* ග්‍රීකවරු ශ්‍රී ලංකාව හැඳින්වූයේ තැප්‍රොබේන් නමිනි

* වෙළෙඳ භාණ්ඩ

  සුවඳ විලවුන්, අලංකාර මැටි බඳුන්, ලිනන් රෙදි, වයින්

# ග්‍රීක ජන ජීවිතයෙහි ප්‍රධාන ස්ථර

* ප්‍රභූන්
* සාමාන්‍ය වැසියන්
* වහලුන්



# ග්‍රීකයන්ගේ ආහාරපාන

එළවළු, මස්, මාළු, බාර්ලි, වයින්









# ග්‍රීකයන්ගේ නිවාස


* ප්‍රභූ ජනයාට මහල් නිවාස පැවතුනි
* මැද මිදුල වටා කාමර, කුස්සිය, ගබඩා කාමර ඉදිකර තිබුණි
* සාමාන්‍ය ජනයා කුඩා නිවාස වල ජීවත් විය



# ග්‍රීක ගෘහ නිර්මාණ ශිල්පය


* විශාල ගොඩනැගිලි හා ඉතා අලංකාර දේවස්ථාන තැනූහ.
* දේවස්ථාන තැනීමේදී ඔප මට්ටම් කළ හුණුගල්, කිරිගරුඬ, වර්ණවත් පිඟන් ගඩොල් භාවිතා කර ඇත.
* පාතීනන් දෙව් මැදුර මෙයට හොඳම නිදසුනකි.





# ග්‍රීක මූර්ති හා ප්‍රතිමා

* කවපෙත්ත විසිකරන්නාගේ ප්‍රතිමාව
* ඇතීනා දෙවඟනගේ ප්‍රතිමාව
* මිනිස් සිරුරේ ස්වභාවිකත්වය නිරූපණය වන ආකාරයෙන් මූර්ති හා ප්‍රතිමා නිර්මාණය කර ඇත
* ප්‍රතිමා නිර්මාණයේදී ඇත් දත් හා රන් වැනි දුර්ලභ ද්‍රව්‍ය යොදාගෙන ඇත





# ග්‍රීක නාට්‍ය

* නාට්‍ය ප්‍රධාන වර්ග දෙකකි
    * සුඛාන්ත
    * දුක්ඛාන්ත


# ග්‍රීක නාට්‍යකරුවෝ


* සොපොක්ලීස්
* යුරිපිඩීස්
* ඇරිස්ටොපනීස්
    * ග්‍රීසියේ ඉපැරණි රඟහලක්




# ග්‍රීක සාහිත්‍ය

* සාහිත්‍ය පොත් ලිවීමේදී ග්‍රීක භාෂාව යොදා ගැනිණි
* වීර කාව්‍ය හා ඉතිහාස කතා වැනි උසස් සාහිත්‍ය නිර්මාණ බිහිවිය
* හෝමර් කවියාගේ ඉලියඩ් හා ඔඩිසි ප්‍රකට ග්‍රීක වීර කාව්‍ය දෙකකි
* ග්‍රීසියේ විසූ ඉතිහාසකරුවෝ
  * පැසිඩිඩීස්
  * හෙරඩෝටස්
  * ඇරිස්ටෝටල්
  * තුසිඩිඩීස්





Herodotus
Thucydides

# ග්‍රීක අධ්‍යාපන ආයතන

* ප්ලේටෝගේ - ඇකඩමි
* ඇරිස්ටෝටල්ගේ - ලයිසියම්




# ග්‍රීක දර්ශනය

* සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් ප්‍රසිද්ධ ග්‍රීක දාර්ශනිකයෝ විය
* ග්‍රීක ජාතික හිපොක්‍රටීස් බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස සැලකේ
* මෙම යුගයේ ජීවත් වූ ආකිමිඩීස් උසස් ගණිතඥයකු මෙන්ම විද්‍යාඥයකුද විය

හිපොක්‍රටීස්






ආකිමිඩීස්



# ආගම

* ග්‍රීසියේ දේව වන්දනය වැඩි වශයෙන් දැකගත හැකි විය
* ග්‍රීසියේ එක් එක් නගර රාජ්‍ය වලට වෙන් වෙන් වූ දෙවිවරු සිටියහ
* සියුස් දෙවියා ග්‍රීක දේව පරපුරේ ප්‍රධානියාය.
* ඇතීනා  දෙවඟන සියුස් දෙවියාගේ දියණියයි
* ඇතීනා දෙවඟන වෙනුවෙන් පාතීනන් දෙව් මැදුර ඉදිකර ඇත

සියුස් දෙවියා




ඇතීනා දෙවගන



# ක්‍රීඩා

* දිවීම
* මල්ලවපොර
* බර ඉසිලීම
* කවපෙත්ත විසි කිරීම
* ඔලිම්පික් ක්‍රීඩාවේ ආරම්භයද ග්‍රීකයන් අතින් සිදුවිය







# ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද

* ප්‍රජාතන්ත්‍රවාදය
* ඔලිම්පික් ක්‍රීඩාව
* යුරෝපා චින්තනය වර්ධනය වීම
* නූතන යුරෝපා ශිෂ්ටාචාරය ගොඩනැගීමට මූලික පදනම වැටීම

**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| ඉතිහාසය | 7 | 3 | 05. යුරෝපයේ පැරණි ශිෂ්ටාචාර<br>ග්‍රීක ශිෂ්ටාචාරය- ඇගයීම |

**සැකසුම: රුවනි නිරාෂා පතිරගේ**
**බප/හො/දොන් පේද්‍රික් ම.වි**

1. ග්‍රීක ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශ නම් කරන්න
2. ග්‍රීක ශිෂ්ටාචාරයට අයත් විශාලතම දූපත කුමක්ද?
3. ග්‍රීසියේ වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇති කන්ද කුමක්ද?
4. ක්‍රීට දිවයින මුල් කරගෙන පැවති පැරණි ශිෂ්ටාචාරය කුමක්ද?
5. ග්‍රීක ශිෂ්ටාචාරය ඇරඹුණු කාල වකවානුව ලියන්න
6. පෞර රාජ්‍ය යනු මොනවාද?
7. පෞර රාජ්‍ය දෙකක් නම් කරන්න
8. පෞර රාජ්‍ය වල කැපී පෙණෙන ලක්ෂණ තුනක් ලියන්න
9. ඇතන්ස් රාජ්‍යයේ ස්වර්ණමය යුගය ඇති වූයේ කිනම් කාලයේද?
10. ග්‍රීසියෙහි රජ කළ රජවරුන් දෙදෙනෙක් නම් කරන්න
11. ග්‍රීක ශිෂ්ටාචාරයෙහි ප්‍රධාන වගාවන් නම් කරන්න
12. ග්‍රීක ශිෂ්ටාචාරයෙහි සත්ත්ව පාලනයේදී යොදාගත් සතුන් නම් කරන්න
13. ග්‍රීසිය සමග වෙළඳ සම්බන්ධතා පැවැත්වූ රටවල් මොනවාද?
14. ග්‍රීකවරුන් ලංකාව හැඳින්වූ නම කුමක්ද?
15. ග්‍රීක වරුන්ගේ වෙළඳ භාණ්ඩ නම් කරන්න
16. ග්‍රීක සමාජයේ ප්‍රධාන පුද්ගල කොටස් තුන නම් කරන්න

17. ග්‍රීකයන්ගි පහත සඳහන් නිර්මාණ වල විශේෂතා සඳහන් කරන්න

ග්‍රීක නිවාස

ගෘහ නිර්මාණ ශිල්පය

මූර්ති හා ප්‍රතිමා

18. ප්‍රධාන ග්‍රීක නාට්‍ය දෙවර්ගය නම් කරන්න

19. හෝමර් කවියා විසින් රචනා කරන ලද ග්‍රීක වීර කාව්‍ය මොනවාද?

20. සමකාලීන ග්‍රීක නාට්‍යකරුවන් ,දාර්ශනිකයන්, ඉතිහාසකරුවන්, විද්‍යාඥයන් නම් කරන්න

| නාට්‍යකරුවන් | දාර්ශනිකයන් | ඉතිහාසකරුවන් | විද්‍යාඥයන් |
|---|---|---|---|
| | | | |
| | | | |

21. සමකාලීන ග්‍රීක අධ්‍යාපනික ආයතන හා ඒවායේ නිර්මාතෘවරුන් දක්වන්න

22. ග්‍රීකයන්ගේ ආගමික ඇදහීම් පිළිබඳ වාක්‍ය පහක් ලියන්න

23. ග්‍රීක ක්‍රීඩා වර්ග නම් කරන්න

24. ග්‍රීක ශිෂ්ටාචාරයේ ලොවට උරුම වූ දායාද මොනවාද?

**සවියෙන් පෙරට අපි එකට**

***e*- ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| **ඉතිහාසය** | **7** | **3** | **05. යුරෝපයේ පැරණි ශිෂ්ටාචාර<br>ග්‍රීක ශිෂ්ටාචාරය- පිළිතුරු** |

**සැකසුම: රුවනි නිරාෂා පතිරගේ**

**බප/හො/දොන් පේද්‍රික් ම.වි**

1. බටහිරින් අයෝනියානු මුහුදටත්, නැගෙනහිරින් ඊජියන් මුහුදටත් මැදිව මධ්‍යධරණී මුහුදට නෙරා පිහිටි අර්ධද්වීපය හා ඊට දකුණින් පිහිටි ක්‍රීට දිවයින ඇතුලු ප්‍රදේශය ග්‍රීක ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශ වේ.

2. ක්‍රීට දූපත

3. ඔලිම්පස් කන්ද

4. මිනෝවන් ශිෂ්ටාචාරය

5. ක්‍රි.පූ 2000

6. පෞර රාජ්‍ය යනු ග්‍රීසියේ නගර ආශ්‍රිතව නිර්මාණය වූ රාජ්‍ය

7. ඇතන්ස්, ස්පාටා

8.

භූමි ප්‍රදේශය කුඩා වීම

ජනගහනය සීමිත වීම

පුරවැසියන්ට පමණක් දේශපාලන අයිතිවාසිකම් ලැබීම

9. පෙරික්ලීස් නම් පාලකයාගේ කාලයේය

10. පිලිප් රජු, මහා ඇලෙක්සැන්ඩර් රජු

11. තිරිඟු ,බාර්ලි ,ධාන්‍ය ,මිදි ,ඔලිව්

12. ගවයන්, එළුවන් ,බැටළුවන්

13. ඉන්දියාව, ශ්‍රී ලංකාව, චීනය

14. තැප්‍රොබේන්

15. සුවඳ විලවුන්, අලංකාර මැටි බඳුන්, ලිනන් රෙදි, වයින්

16. ප්‍රභූන්, සාමාන්‍ය වැසියන්, වහලුන්

17. ***ග්‍රීක නිවාස***- ප්‍රභූ ජනයාට මහල් නිවාස පැවතීම, මැද මිදුල වටා කාමර කුස්සිය ගබඩා කාමර පැවතිනි, සාමාන්‍ය ජනයා කුඩා නිවාස වල ජීවත් විය

***ගෘහ නිර්මාණ ශිල්පය***-අලංකාර දේවස්ථාන ඉදි කළහ, දේවස්ථාන තැනීමට හුණුගල් කිරිගරුඬ වර්ණවත් පිගන් ගඩොල් භාවිත කර ඇත. පාතීනන් දෙව් මැදුර මීට හොඳම නිදසුනකි.

***මූර්ති හා ප්‍රතිමා***- මිනිස් සිරුරේ ස්වභාවිකත්වය නිරූපණය වන ආකාරයට මූර්ති නිර්මාණය කිරීම (කවපෙත්ත විසිකරන්නාගේ ප්‍රතිමාව), ප්‍රතිමා නිර්මාණයේදී ඇත් දත් හා රන් වැනි දුර්ලභ ද්‍රව්‍ය භාවිතා කිරීම (ඇතීනා දෙවගනගේ ප්‍රතිමාව)

18. සුඛාන්ත, දුක්ඛාන්ත

19. ඉලියඩ්, ඔඩිසි

20.

| නාට්‍යකරුවන් | දාර්ශනිකයන් | ඉතිහාසකරුවන් | විද්‍යාඥයන් |
|---|---|---|---|
| ඊස්කලස්<br>සෙපොක්ලීස්<br>යූරිපිඩීස්<br>ඇරිස්ටොපනීස් | සොක්‍රටීස්<br>ප්ලේටෝ<br>ඇරිස්ටෝටල් | පැසිසිඩීස්<br>හෙරඩෝටස්<br>ඇරිස්ටෝටල්<br>තුසිඩිඩීස් | හිපොක්‍රටීස්<br>ආකිමිඩීස් |

21. ප්ලේටෝ- ඇකඩමි ඇරිස්ටෝටල්- ලයිසියම්

22. **දේව වන්දනය දැකගත හැකිය.

**ග්‍රීසියේ එක් එක් නගර රාජ්‍ය වලට වෙන්වූ දෙවිවරු සිටීම.

**සියුස් දෙවියා ග්‍රීක දේව පරපුරේ ප්‍රධානියාය.

**සියුස් දෙවියන්ගේ දියණිය ඇතීනා දෙවගනයි.

**ඇතීනා දෙවගන වෙනුවෙන් පාතීනන් දෙවොල ඉදිකර ඇත.

23. දිවීම, මල්ලවපොර, බර ඉසිලීම, කවපෙත්ත විසි කිරීම, ඔලිම්පික් ක්‍රීඩාව

24. ප්‍රජාතන්ත්‍රවාද, ඔලිම්පික් ක්‍රීඩාව, ගෘහ නිර්මාණ ශිල්පය, ග්‍රීක නාට්‍ය